# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2082/56 - 2018 අගෝස්තු මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2018.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීමයි

4/3/1/93.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 730 B, කටුකුරුන්ද, ග්‍රාම නිලධාරී කොට්ඨාස තුල පිහිටියා වූ සර්වේයර් ජනරාල්ගේ අංක මූ.පි.ක. 4688 දරන සැලැස්මේ පහත සඳහන් බිම් කැබැලි.

**කැබලි අංක 01**
ඉඩමේ නම: උස්ලියනගේ වත්ත, උස්ලියනගේ මහ වත්ත, මාදන් ගහවත්ත; විස්තරය: ප්‍රවේශ මාර්ගය සහ ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අළුත්ගම දර්ගා නගරය "රිවර් සයිඩ්" හි පදිංචි සාදික් මරික්කාර් හසන් මරික්කාර් සහ තවත් අය; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.1850.

**කැබලි අංක 02**
ඉඩමේ නම: උස්ලියනගේ වත්ත, උස්ලියනගේ මහ වත්ත, මාදන් ගහවත්ත; විස්තරය: ගෙවත්ත, ගොඩනැගිල්ලක් සහ සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අළුත්ගම දර්ගා නගරය "රිවර් සයිඩ්" හි පදිංචි සාදික් මරික්කාර් හසන් මරික්කාර් සහ තවත් අය; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.8790.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2018 අගෝස්තු මස 30 වැනි දින පූර්ව භාග 10.30ට කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 අගෝස්තු මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම් දිය යුතුය. ඉඩමට ඇති තම අයිතිය සනාථ කිරීම සඳහා අදාළ ඔප්පු, ප්ලෑන් හා අනෙකුත් ලියවිලි පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතුය.

බුද්ධිකා රුවනි සමරතුංග,
ප්‍රාදේශීය ලේකම්,
කළුතර.

2018 ජූලි මස 30 වැනි දින,
කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 596


1A - G 28217 - 20 (2018/08)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :
4-3/7/2011/එච්ඩබ්ලිව්/58.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, බිංතැන්න පත්තු දකුණ සුළු කොට්ඨාශයේ, පදියතලාව (කොට්ඨාශ අංක. 140/ඒ) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පදියතලාව ගමේ පිහිටි භූලක්ෂණාත්මක මූලික පිඹුරු අංකය. 49, අතිරේක අංකය. 50 හා 2016.03.08 දිනැති පිඹුරේ සඳහන් කැබැල්ල සඳහා මා විසින් 2002/40 හා 2017.01.19 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇති කැබලි අංක. 3496 වැනි කැබැල්ලෙහි රජයට අත්කර ගන්නා ඉඩම් ප්‍රමාණය පිළිවෙලින් හෙක්ටයාර් 0.0030 ලෙස නිවැරදි විය යුතු බව දන්වමි.

**06. කැබලි අංක 3496**

ඉඩමේ නම: පදියතලාව; විස්තරය: ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: 244 වැනි බිම් කැබැල්ලේ කොටසක්, (වෙන් කරන ලද මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) (පදියතලාව පදිංචි වනිගසේකර මුදියන්සේලාගේ ගුණවර්ධන අනවසරයෙන් භුක්ති විඳී, පේරාදෙණිය, වෙන්කලඩි මාර්ගය සඳහා අවශ්‍යව ඇත); ප්‍රමාණය: හෙක්. 0.0030 ලෙස නිවැරදි විය යුතු බව මෙයින් දන්වමි.

ආර්. එම්. එන්. විජයතුංග,
ප්‍රාදේශීය ලේකම්,
පදියතලාව.

2018 ජුනි මස 18 වැනි දින,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
අම්පාර දිස්ත්‍රික්කය,
පදියතලාව.

08 - 620

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.